අන්තර්ජාලයෙන් යූටියුබ් වීඩියෝ නරඹා ගිනි අවි නිපැදවූ දෙදෙනෙක් අත්අඩංගුවට ගත් පුවත, ජූනි 21, 2023 දින පුවත්පත් කිහිපයකම වාර්තා වී තිබිණි. ඒ අයුරින්ම ලිංගික සේවා හලක කළ වැටලීමකින් අත්අඩංගුවට ගත් ලිංගික ශ්‍රමිකයින් සිව් දෙනෙකුගෙන් එක් අයෙකුට ගොනෝරියා නමැති සමාජ රෝගය වැළඳී ඇති බවට වෛද්‍ය පරීක්ෂණ මගින් හෙළිව ඇති බව යන පුවත ද, ජූනි 22, 2023 දින පුවත්පත් කිහිපයක වාර්තා වී තිබුණි.

මෙම වාර්තාකරණයන් අතුරින්, අරුණ, දිනමිණ, සහ දිවයින පුවත්පත්, සැකකරුවන් අරගලයේ සංවිධායකයින් හෝ ඔවුනට සම්බන්ධ අය බව පුවතේ සිරස්තලය තුළම සඳහන් කොට තිබුණි.

ජූනි 22, 2023 දින අරුණ පුවත්පත් කතුවැකියේ ඉහත සිද්ධීන් පිළිබඳව සඳහන්ව තිබුයේ "මේ අනුව බැලූ විට එක්කෝ අද මෙවැනි චෝදනා ලක්වන අයෙක් වේ නම් ඔහු අරගලකරුවකු යැයි නිතැනින්ම හංවඩුවක් ගැසෙන්නේය" යනුවෙනි. එසේ කතුවැකියේ සඳහන්ව තිබුණද, එම අදහස් පුවත්පත් වාර්තාකරණයේදී නොසලකන බව පහත දැක්වෙන පුවත් සිරස්තල තුළින් පසක් වේ.

ඒ අනුව,

1) මෙහිදී අත්අඩංගුවට පත් සැකකරුවන්, "අරගලයේ ක්‍රියාකාරිකයෙකු" හෝ "අරගලයේ ප්‍රබලයෙකු" වීම, මෙම සිදුවී ඇතැයි පැවසෙන සිද්ධීන් වලට අදාළ වන්නේ කෙසේද?

2) අදාළ නොවේ නම්, මෙම පුවත් ඉදිරිපත් කරන ඇතැම් පුවත්පත්, සිරස්තල තුළම "අරගලය" සම්බන්ධයෙන් සඳහන් කිරීමේ පදනම කුමක්ද? එය "අරගලය" අපරාධකාරී ක්‍රියාවන්ට සම්බන්ධ කිරීමට සහ, "අරගලය" සහ ඊට සහභාගී වූ ඕනෑම අයෙකු පිළිබඳව අවමානයෙන් යුතුව සැලකුම් කිරීමේ ආකල්පයක් ඇති කිරීමේ ප්‍රයත්නයක් ද? (එවැනි ප්‍රයත්නයන් පිළිබඳව Ethics Eye අපි මින් පෙරද විමසා ඇත්තෙමු.)

3) ඒ අනුව, මෙම පුවත් වඩාත් අපක්ෂපාතී අයුරින් වාර්තා කර හැක්කේ කෙසේ ද?

(මෙහි සඳහන් වන "ගණිකා"සහ "සුරූපී" යන යෙදුම් සම්බන්ධයෙන් ද, අපි වෙනත් පෝස්ටුවලින් සාකච්ඡා කරන්නෙමු.)

අදාළ නොවන සන්දර්භයන් තුළ "අරගලය" හා ඊට සහභාගී වූවන්ව අවමානාත්මකව දැක්වීම් පිළිබඳ අපි මින් පෙර සිදුකළ ප්‍රශ්න කිරීම් වෙතට මෙතැනින් පිවිසෙන්න:
https://web.facebook.com/.../a.23402767.../1947261628962218/
**https://www.facebook.com/.../a.23402767.../1944538695901178/**
**https://www.facebook.com/.../a.23402767.../1926317934389921/**

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!